# බුදුරදුන් කතුන්ට දෙසූ උපදෙස්

උපාධි සමාප්ත වර්ෂයේ,
**දෙරකුඹුරේ ධම්මවංස භික්ෂු**

බුදු දහම සත්වයා සසර දුකින් මුදවාලනු සඳහා දේශනා කරන ලද ලෝකෝත්තර දහමකි. ලෞකික පුද්ගලයෙකු ලෝකෝත්තර මාර්ගයට යොමුකරවීම මේ ක්‍රියා මාර්ගයේ ඉතා දුෂ්කර අවස්ථාවයි. පස්කම් සැප කෙරෙහි නියැලී තම ඉන්ද්‍රියන් පිනවා ගැනීම ජීවිතයේ එකම කාර්ය ලෙස පිළිගෙන සිටින පුද්ගලයෙකු එම මිථ්‍යා පිළිගැනීම්වලින් මුදවා නිවැරදි ධර්ම මාර්ගයක ගමන් කරවීම ඉතාමත්ම අපහසු කාර්යයකි. පුහුදුන් පුද්ගලයා ප්‍රකෘතියෙන්ම දුස්සීලයෙකි. සිතට වහල්වූවෙකි. පව, පින හෝ හොඳ නරක තේරුම් ගත නොහැක්කෙකි. මෙවැනි පුද්ගලයෙකු යහපතට හැරවීමට බුදු සමයෙන් ලැබෙන පිටිවහල අනන්තය. බෞද්ධ ශිෂ්ටාචාරය යන නමින් අද අප කථා කරන්නේ පුද්ගලයෙක් යහපතට හැරවීමේ පාඩම් මාලාව උඩ සකස්වූ අපේ පැරණි ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය විසින් පරපුරෙන් පරපුරට ගෙන ආ ජීවන මාර්ගයයි.

බුදුරජාණන්වහන්සේ දේශනා කරන ලද අවවාද මාර්ග අතරින් ස්ත්‍රිය සඳහා දේශනා කරන ලද ධර්මවාදය මේ ලිපියෙන් ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙමි. එම ස්ත්‍රීන් සඳහා දේශිත ධර්මවාද කොටස් දෙකකට බෙදිය හැක. ගෘහ ජීවිතයට සම්බන්ධ ස්ත්‍රීන්ට දෙන ලද අවවාද සහ සුගතිගාමී හෝ මොක්ෂගාමී මාර්ගයට පිළිපන් ස්ත්‍රීන්ට දෙන ලද අවවාද වශයෙනි. බුද්ධ කාලයේ බමුණන් ස්ත්‍රිය පිළිබඳ දරූ කනගාටුදායක අදහස් නිසා ගෙවල්වල සිරවී සිටි ස්ත්‍රීන්ට බුදුරදුන්ගේ ධර්ම මාර්ගය නිසා ප්‍රමාණවත් නිදහසක් ලැබුන බව සිතන්නට කරුණු තිබේ.

ඉත්ථිභාවො කිං කයිරා - චිත්තම්හි සුසමාහිතෙ
ඤාණම්හි වත්තමානම්හි - සම්මා ධම්මං විපස්සතො

(සංයුත්ත නිකාය - භික්ඛුනී සංයුත්ත - 2 සූත්‍රය)

සිත සකස් කළ කල්හි, එසේම ප්‍රඥාව ඇති කල්හි, මානව කරුණු සලකා බැලීමට හැකිනම් ස්ත්‍රියක්වීමේ කිසි විශේෂත්වයක් නැත.

මෙයින් දෙන අදහස ඉතා විශාලය. ස්ත්‍රියක් හෝ පුරුෂයෙකුවීම ගණන් ගත යුත්තක් නොවේ. ගණන් ගත යුත්තේ සිත සංවරවීමත්, කරුණු සලකා බැලීමට නුවණත් තිබේ ද යන්න පමණෙකි; යන්න මෙයින් දෙන උපදේශයයි. මහා බ්‍රිතාන්‍යය ඉර නොබසින අධි-රාජ්‍යයක් බවට පත්වූයේ වික්ටෝරියා රාජිණියගේ පාලන කාලයේ බව බ්‍රිතාන්‍ය ඉතිහාසය කියයි. එළාර රජුගෙන් ශ්‍රී ලංකාව බේරා ගැනීමට ගැමුණු රජු මෙහෙයෙව්වේ ද, යුද්ධෝපදේශ දුන්නේ ද විහාර මහා දේවිය බව ලංකා ඉතිහාසය කියයි. බුදුරජාණන්වහන්සේ ප්‍රධාන දායකයා අනේපිඩු සිටාණන් වූ අතර, විශාඛාව ස්ත්‍රී පක්ෂයෙන් එයට නොදෙවෙනි තැනක් දරුවාය. ඒ අනුව ස්ත්‍රියක් හෝ වේවා පුරුෂයෙක් හෝ වේවා එයින් වැඩක් නැත. අවශ්‍ය වන්නේ පුද්ගලයාගේ මානසික තත්ත්වයේ ප්‍රබල බව පමණෙකි.

විදේශීය පාලන කාලය තුළ ඉංග්‍රීසි භාෂාව උගත් ධනවත් සිංහල පවුල්වල ස්ත්‍රීන් විදේශිකයන් ආශ්‍රයට වැටීම නිසා අවුරුදු දෙදහස් ගණනක් තුළ මෙරට ස්ත්‍රීන් තුළ පැවැති ආගමික හැදියාව හා ඇවැතුම් පැවැතුම් පමණක් නොව කුල කතකට හිමි ලජ්ජා භය දෙක කනගාටුදායක ලෙස පිරිහී ගිය බව අපි දනිමු. ඇතැම් පවුල් බුදු සමය ප්‍රතික්ෂෙප කොට විදේශීය ආගම් වැළඳ ගත් බව ද අපි දනිමු. උසස් පුද්ගලයන් ලෙස පිළිගනු ලැබූ එම ස්ත්‍රී පුරුෂයන් දෙස බලා ඔවුන් අනුගමනය කිරීම තමාගේ තත්ත්වය උසස් කර ගැනීමේ මාර්ගයක් කොට ධනවත් පවුල්වල ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ද ඒ විදේ-ශීය ගතිගුණවලට මෙන්ම සිරිත් විරිත්වලට ද ඇබ්බැහි වූහ. එම විදේශීය ගති සිරිත්වලට ඇබ්බැහිවීමේ ප්‍රතිඵල අද ද අපි භුක්ති විඳින්නෙමු.

ස්වාමි භක්තිය ස්ත්‍රිය තුළින් ඉවත්විය. පතිව්‍රතාව යනු කුමක්ද? යන තැනට පත්විය. පුරුෂ පක්ෂය ඊට වඩා දෙතුන් ගුණයකින් දුසිරිතට පෙළඹිණි. විදේශීය පාලනයෙන් නිදහස ලැබීමෙන් පසු මේ තත්ත්වය යහපත් අතට හැරෙනු ඇතැයි සමහරු බලාපොරොත්තු වූහ. නමුත් සිදුවූයේ තිබුණු තත්ත්වය තවත් බරපතල වීමය. විදේශීය ආභාෂයෙන් ලත් දුශ්චරිත දුරාජීවයන් පිටිසර ගම්බද පළාත් පවා ගිල ගැනීමයි.

ස්වකීය ස්වාමියා තමාගේ ඉටුදෙවියා ලෙස සැලකීම බොදු කුල කතගේ සිරිත විය. ඇගේ ඒ උදාර සම්භාවනාව ස්වාමියාගේ ප්‍රසාදයටත්, භාර්යාව කෙරෙහි පවතින ප්‍රේමය වැඩිදියුණුවීමටත් හේතු විය. ස්වාමියා නොමඟ යන බව දකින භාර්යාවගේ නෙත් කොණින් නැගෙන කඳුළු බිඳුවලට කොතරම් මහේශාක්‍ය හැඩිදැඩි පුද්ගලයෙකු වුව ද හෙල්ලුම් කෑම අරුමයක් හෝ පුදුමයක් නොවේ. එබඳු අඹුසැමි යුවලක් අපට දක්නට ලැබුණොත් ඒ කලාතුරකිනි.

විවාහ ජීවිතයට ඇතුළත්වන කුල දුහිතෘන් විසින් දැනගත යුතු කරුණු 5 ක් බුදුරජාණන්වහන්සේ විවාහය සඳහා සූදානම්ව සිටි උග්ගහ ගෘහපතියාගේ දූවරුන්

උදෙසා දේශනා කළහ. එම කරුණු එදා භාර්යාව හා ස්වාමියා අතර තිබූ අන්‍යෝන්‍ය සම්බන්ධය කෙබඳු එකක් දැයි දැනගැනීමට අවස්ථාවක් ලැබේ. එම කරුණු මෙහි පහත දක්වමු.

I තස්මා තිහ කුමාරියො එවං සික්ඛිතබ්බං, යස්ස වො මාතා පිතරො භත්තුනො දස්සන්ති. අත්ථකාමා හිතෙසිනො අනුකම්පකා අනුකම්පං උපාදාය තස්ස භවිස්සාම පුබ්බුට්ඨායිනියො පච්ඡා නිපාතිනියො කිංකාර පටිස්සාවිනියො මනාපචාරිනියො පියවාදිනියො ති එවංහි කුමාරියො සික්ඛි තබ්බං.

II යෙ තෙ භත්තුගරුනො භවිස්සන්ති. මාතාතිවා පිතාතිවා සමණ බ්‍රාහ්මණතිවා තෙ සක්කරිස්සාම. ගරු කරිස්සාම, මානෙස්සාම, පූජෙස්සාම, අංගාගතෙච ආසනොදකෙන පූජෙස්සාමාති. එවංහි කුමරියො සික්ඛි තබ්බං.

III යෙ තෙ භත්තු අබ්භන්තරා කම්මන්තා උණ්ණානිවා කප්පාසානිවා තත්ථ දක්ඛා භවිස්සාම අනලසා තත්‍රූපාය විමංසාය සමන්නාගතා අලං කාතුං අලං සංවිධාතුනති. එවංහි වො **කුමරියො සික්ඛි තබ්බං.**

IV යො සො භත්තු අබ්භන්තරො අන්තො ජනො දාසාතිවා පෙස්සාතිවා කම්මකරාතිවා තෙසං කතඤ්ච කතතො ජානිස්සාම. අකතඤ්ච අකතතො ජානිස්සාම. ගිලානකානඤ්ච බලාබලං ජානිස්සාම. ඛාදනීයං භොජනීයඤ්චස්ස පච්චයං විභජිස්සාමාති.

V යං භත්තා ආහරිස්සති ධනංවා ධඤ්ඤංවා රජතංවා ජාතරූපංවා තං ආරක්ඛාය. ගුත්තියා සම්පාදෙස්සාම. තස්ස භවිස්සාම, අධුත්තී අථෙනි අසොණ්ඩි අවිනාසිකායොති. එවංහි වො කුමරියො සික්ඛි තබ්බං.

(අංගුත්තර - පඤ්චක නිපාත)

භාවය :

I ස්වාමියාට පළමුව අලුයම අවදි වී ගෙදර දොරෙහි කළ යුතු කටයුතු කරන්නෙමු. රාත්‍රියෙහි සියලු වැඩ සකස්කොට තබා ස්වාමියාට පසුව නිදන්නෙමු. යම් කළ යුතු කටයුත්තක් වේ නම් ඒ ගැන ස්වාමියාගෙන් අසා බලන්නෙමු. ස්වාමියාගේ සිතට ගැලපෙන පරිදි හැසිරෙන්නෙමු. ප්‍රිය වචන කථා කරන්නෙමු.

II එසේම ස්වාමියා ගරුකොට සලකන මව් හෝ පියා හෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන් හෝ යන යම් හිතවත් පිරිසක් වේ ද, ඒ පිරිසට සත්කාර කරන්නෙමු. ගරු කරන්නෙමු. පුදන්නෙමු. ආගන්තුකව පැමිණි විට අසුන් දී පා සේදීමට ජලය දී සලකන්නෙමු.

III එසේම ස්වාමියාගේ යම් අභ්‍යන්තර කටයුතු වූ (එකල පැවැති පරිදි) ලොම් කැපීම, කපු කැටීම ආදී වූ කර්මාන්ත කොටසක් වේ ද, එහි දක්ෂ වෙමු. අනලස් වෙමු. (අලස නොවෙමු). එහි කළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳ විමසා බලමු.

IV එසේම ස්වාමියාගේ දාසිදාස්, කම්කරු ආදී යම් අභ්‍යන්තර පිරිසක්වේ ද, ඔවුන් විසින් කරන ලද වැඩ ඒ ඒ පරිදි දැනගනිමු. ගිලන්වූවන්ගේ සුවදුක් බලමු. කෑම් බීම් බෙදා දෙමු.

V එසේම ස්වාමියා යම් ධන ධාන්‍යාදියක් හෝ රන් රිදී ආදියක් හෝ ගෙන එන්නේ ද, ඒවා ආරක්‍ෂා වන පරිදි ධූර්තියක් (ස්වාමියා හැර වෙනත් පුරුෂයන් සමග හිතවත්කම් ඇතිව ස්වාමියා සතු දේ ඒ සොර සැමියන්ට දෙන්නියක්) නොව සොරකම් කරන්නියක් නොව ක්‍රියා කරන්නෙමු. මෙපරිද්දෙන් කුල කුමරියන් හික්මිය යුතුය.

මෙහි දක්වන ලද උපදෙස් එදාට මෙන්ම අදට ද ගැලපේ. ස්වාමියා අනෙකකු ලෙසත්, තමා අනෙකක ලෙසත් භාර්යාව විසින් නොසැලකිය යුතු බව මෙහි ගැබ්ව ඇත. ස්වාමියාගේ මිත්‍රයා තමාගේ මිත්‍රයා ලෙසත්, ස්වාමියාගේ දෙමාපියන් තමාගේ දෙමාපියන් ලෙසත්, ස්වාමියාගේ ඤාතීන් තමාගේ ඤාතීන් ලෙසත්, ස්වාමියාගේ කම්කරුවන් තමාගේ කම්කරුවන් ලෙසත්, ස්වාමියාගේ ධනෝපායන කටයුතු තමාගේ ධනෝපායන ලෙසත්, ස්වාමියා රැස්කරන ධනය තමා රැස්කරන ධනය ලෙසත්, භාර්යාව විසින් සැලකිය යුතු බව මේ උපදෙස් වලින් දැක්වේ. විවාහ වූ පසු තම දෙමාපියන් හා ස්වාමියාගේ දෙමාපියන් එක හා සමාන තත්ත්වයෙන් සැලකීම භාර්යාවගේ යුතුකමකි. එහෙත් අද සමාජයේ මේ තත්ත්වය බොහෝ දුරට තුනීවී ඇත. එහි වරද තනිකර බිරියටම පැවැරිය නොහැකිය. පුත්‍රයා විවාහවුණු පසු තමාට නොසලකනු ඇතැයි යන සැකය මව තුළ පහළ වන බව පෙනේ. පුතා සිය බිරිඳට වැඩියෙන් හා තමාට අඩුවෙන් සලකන විදියක් පුතාගේ මවට ඉබේම හැඟෙයි.

සමහර විට අසත්පුරුෂ පුත්‍රයන් එසේ කරනත් වැඩි දෙනෙක් එසේ කරන්නේ යයි කිව නොහැකිය. එහෙත් මේ නැන්දා සහ ලේලිය අතර ඇති අරගලය සාමාන්‍ය දෙයක් බවට අද පත්ව ඇත. මේ නිසාම විවාහ වූ පසු තම දෙමාපියන් සමග එකට වාසය කිරීමට බොහෝ දෙනා අකැමැතිය.

මේ අවවාද පහ අතර අවසානයට එන ස්වාමියා සපයන ධනය පිළිබඳ අවවාදය විශේෂයෙන්ම විවාහක ස්ත්‍රීන් විසින් සිතට ගත යුතු අවවාදයකි. ස්ත්‍රිය ස්වභාවයෙන්ම ඊෂ්‍යාවෙන් වටව ගිය අහංකාරයකින් හෙබි තැනැත්තියකි. එනිසාම තම පුළුවන්කාරකම පෙන්වීමට ස්වාමියාගේ ධනය පමණ ඉක්මවා වියදම් කිරීමට පෙළඹෙයි. ඒ අනුව ඔවුනොවුන්ගේ ආර්ථිකය පිරිහීමෙන් විවාහ ජීවිතය අසාර්ථක වෙයි.

බුදුරදුන් කුල කතුන් උදෙසා දේශිත මේ උවදෙස් පිළිපදිමින් යම් කුල දුහිතෘවක් තම ස්වාමියා සමග විවාහ ජීවිතයක් ගත කරන්නේ නම් එම විවාහ ජීවිතය සතුට, සොම්නස, සෞභාග්‍යය පිරි වාසනාවන්ත කුරුලු කැදැල්ලක් වෙනවාට කිසිම සැකයක් නැත. මේ අනුව වාසනාවන්ත ගෘහ ජීවිතයක් ගත කිරීමට කැමැත්තෝ බුදුරදුන් වදාළ අවවාද හා උපදෙස් පිළිපැද ජීවිත සාර්ථක කර ගැනීමට උත්සාහ ගනිත්වා!